IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2014

(දෙවන සෙමෙස්තර පරීක්ෂණය)

(පවත්වන ලද්දේ 2016 මාර්තු)

## BLE 205 - කම්කරු නීතිය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

(2) කාලය පැය තුනයි. (03)

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) අපැහැදිලි අත්අකුරු වලට ලකුණු අඩු කෙරේ.

(6) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

1. (i) සේවා ගිවිසුමක් (contract of service) සේවය සැපයීම සඳහා වන ගිවිසුමකින් (contract for service) වෙනස් කර දක්වන්න.

   (ii) සේවා ගිවිසුමක් හඳුනා ගැනීම සඳහා අධිකරණය විසින් භාවිතා කරනු ලබන මිනුම් දඬු කවරේදැයි නඩු තීන්දු ඇසුරෙන් පැහැදිලි කරන්න.

2. නූතන වැඩ පිළිබඳ ලෝකය (world of work) තුළ සම්ප්‍රදායික රැකියා ගිවිසුම් වර්ග වශයෙන් හඳුනා ගැනෙන රැකියා ගිවිසුම් කවරේදැයි පෙන්වා දෙමින් ඉන් ගිවිසුම් වර්ග දෙකක් පිළිබඳව විවේචනාත්මක විග්‍රහයක් ලියා දක්වන්න.

3. (i) රාජ්‍ය සේවා ක්ෂේත්‍රය පිළිබඳව පැහැදිලි කර ඒ තුළ සේවක - සේව්‍ය සබඳතාවයට අදාලව ක්‍රියාත්මක වන නීති සිද්ධාන්ත විස්තර කරන්න.

   (ii) පෞද්ගලික සේවා ක්ෂේත්‍රය රාජ්‍ය සේවා ක්ෂේත්‍රයෙන් වෙනස් වන ආකාරය පැහැදිලි කර එක් එක් සේවා ක්ෂේත්‍ර තුල රැකියා සුරක්ෂිතතාව තහවුරු කිරීම පිණිස පවතින යාන්ත්‍රණ කවරේදැයි සඳහන් කරන්න.

4. (i) 1950 අංක 43 දරණ කාර්මික ආරවුල් පනත පැනවීමෙන් සපුරා ගැනීමට අපේක්ෂා කරනු ලැබූ පරමාර්ථ කවරේද?

   (ii) එම පනතට හඳුන්වා දී ඇති වැදගත් සංශෝධනයක් තෝරා ගෙන එම සංශෝධනයෙන් කාර්මික ආරවුල් නිරවුල් කිරීමේ විෂය පථය වෙනසකට ලක් කර ඇත්නම් ඒ කෙසේදැයි පහදා දෙන්න.

5. ශ්‍රී ලංකා වරාය සේවක සමිතිය සහ කොළඹ වරාය අධිකාරිය අතර සේවක වෘත්තීය සමිති කාර්යාලයක් වරාය භූමිය තුළ ස්ථාපිත කිරීමට අදාලව මතභේදයක් හට ගෙන ඇත. දෙපාර්ශවයම තම මතය වෙනුවෙන් දැඩි ස්ථාවරයක පිහිටා කටයුතු කරන නමුත් කාර්මික සාමයට බාධා ඇති නොවන පරිදි එකී ආරාවුල විසදා ගැනීමට අපේක්ෂා කෙරේ. දිනපතා පුවත්පතක පලවූ ප්‍රවෘත්තියක් මඟින් කම්කරු කොමසාරිස් ජනරාල්වරයා මෙම කාර්මික නොසන්සුන්තාව/ මතභේදය පිළිබඳව දැන ගනියි.

   උක්ත ආරාවුල නිරවුල් කිරීමේ අවකාශයක් කාර්මික ආරාවුල් පනත යටතේ කම්කරු කොමසාරිස් ජනරාල්වරයාට පවතින්නේදැයි විමසා බලා කාර්මික ආරවුල් පනතේ විධිවිධාන ඇසුරෙන් ඔහුට පැවරී ඇති ව්‍යවස්ථාපිත වගකීම පැහැදිලි කරන්න.

6. වෙහෙසකර සාමූහික කේවල්කරණයක් සාර්ථක ලෙස නිමා කිරීමෙන් පසුව සමස්ථ ලංකා ප්‍රවාහන සේවක වෘත්තීය එකමුතුව සහ ශ්‍රී ලංකා ප්‍රවාහන ආයතනය නව සේවා නියමයන් හා කොන්දේසි පිළිබඳ එකගතාවයකට එළැඹ ඇත.

   එකී එකඟතාවට නෛතිකමය පිළිගැනීමක් අත්පත් කර ගැනීම වෙනුවෙන් කාර්මික ආරවුල් පනත යටතේ පවතින ප්‍රතිපාදන කෙසේ ක්‍රියාත්මක කල යුතුවේදැයි එකී පාර්ශව ඔබගෙන් විමසා සිටිති.

   සමස්ත ලංකා ප්‍රවාහන සේවක වෘත්තීය එකමුතුවට සහ ශ්‍රී ලංකා ප්‍රවාහන ආයතනයට උචිත උපදේශය ලියා දක්වන්න.

7. (i) සේවා ගිවිසුමක් අවසන් වන ආකාරයන් සැකෙවින් පැහැදිලි කරන්න.

(ii) "විෂමාචාරයක් මත සේවයෙන් නෙරපා හැරීම" (Dismissal on Misconduct) යනුවෙන් කම්කරු නීතිය තුල කුමක් අදහස් වන්නේදැයි උදාහරණ සහිතව පෙන්වා දෙන්න.

8. පහත දැන්වෙන ඒවා අතුරෙන් <u>දෙකක්</u> පිළිබඳව දැනට බලපවතින නෛතික තත්වය විග්‍රහ කරන්න.

(i) 1950 අංක 43 දරණ වරින් වර සංශෝධිත කාර්මික ආරවුල් පනත යටතේ ස්වේච්ඡා බේරුම්කරණය සහ අනිවාර්ය බේරුම්කරණයට අදාල ක්‍රියා පටිපාටිය;

(ii) කම්කරු විනිශ්චය සභාවක් මගින් සේවායෝජකට එරෙහිව ප්‍රකාශයට පත්කල නියෝගයකට එරෙහිව අභියාචනයක් කිරීම සහ අභියාචනයක් නොකර සිටීම;

(iii) වෘත්තීය සමිති ආඥා පනත යටතේ වෘත්තීය සමිතියක් ලියාපදිංචි කිරීමෙන් අත්පත් කරගත හැකි නෛතික ප්‍රතිලාභ සහ ලියාපදිංචි නොකිරීම නිසා උද්ගත වන නෛතික ආනුෂාංග කවරේද?